# පුරාණ සිංහලේ ඇඳුම් ආයිත්තම්

ආර්.එම්.අයි.යූ. පතිරණ

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය.
iroshaudani5@gmail.com

**ප්‍රමුඛ පදඃ පුරාණ, ඇඳුම් ආයිත්තම්, පූර්ව ඓතිහාසික, පැළඳුම්**

## හැඳින්වීම

පුරාණ සිංහලේ ඇඳුම් ආයිත්තම් පිළිබඳව කරන ලද අධ්‍යයනයක් වන මෙහිදී ලාංකිකයන්ගේ ඇඳුම් පිළිබඳ ඉතිහාසය, ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වැඩවසම් අවධිය තෙක් කාල පරාසය තුළ විමර්ශනය කරනු ලැබේ.

මෙහිදී ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මානවයා ඇඳුම් කළ අයුරු හා එය ඔවුන්ගේ විලි වසා ගැනීමට වඩා හුදෙක් දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමට විකල්ප ලෙෂ භාවිත කළේද යනුවෙන්, පුරාණ ලාංකික ප්‍රජාවගේ ඇඳුමෙහි ආරම්භය,ව්‍යාප්තිය හා විකාශනය ඇසුරින් වටහාගත හැකිය.

විශේෂයෙන් පුරාණ ලංකාවේ ඇඳුම,සමාජ තත්ත්වයන් හා සමාජ සංස්කෘතින් පිළිඹිඹු මාධ්‍යයක් විය. විශේෂයෙන් රජවරුන්,ප්‍රභූන්, වංශවතුන්, සමාන්‍ය ජනතාව ආදි කොටගත් සමාජයේ විවිධ තරාතිරම්වලට අයත් ජනතාව විසින් තම අනන්‍යතාවය හා මහේශාක්‍ය බව පෙන්නුම් කිරිමට ඇඳුම පාදක කොට ගත්තේ කෙසේද යන්න මෙහිදි අධ්‍යනය කරනු ලැබේ.

ප්‍රායෝගික වශයෙන් ආරම්භක සමයේ ඇඳුමේ අවශ්‍යතාව ශරීර ආවරණය කර ගැනීම පමණක් වුවද පසුකාලීනව එය ආයිත්තමක් ලෙස ප්‍රයෝජනයට ගැනිණි. මෙහිදි ඇඳුමට පරිබාහිරව ඊට වෙනත් අංග එකතු වී ඇත.

මේ අනුව සමස්තයක් ලෙස උක්ත කරුණ මත පුරාණ සිංහලේ ජනයා භාවිත ඇඳුම් හා ආයිත්තම් අධ්‍යයනය ප්‍රමුඛ වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ඉතිහාසය පූර්ව ඉතිහාසය තෙක් දිව යන අතර, මේ සඳහා දෘශ්‍යමාන සාධක එනම් සජීවීව නොමැති නිසාවෙන් දැනට හමුවන සාහිත්‍යමය මූලාශ්‍රයන් හා පුරාවිද්‍යාත්මන අවශේෂ අධ්‍යයනයෙන් දත්ත රැස් කරගනු ලැබිණ. මෙහිදි මෙරට ඉතිහාසය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරෙන වංශකතා, වර්ණනාවන් ඇසුරෙන් ද බිතු සිතුවම් ඇසුරෙන් ද පුරාවිද්‍යාත්මක වශයෙන් කැටයම් හා මූර්ති ඇසුරින් ද විශේෂයෙන් අධ්‍යයන කටයුතු කරනු ලැබිණ.

## ප්‍රතිඵල සාකච්ඡාව

පූරාණ සිංහලේ ඇඳුම් ආයිත්තම්හි අධ්‍යයනයේදි ඇඳුම වූකලි විලිවසා ගැනීමේ අරමුණටත් වඩා හුදෙක්ම ක්‍රියාත්මක වූයේ අධික සීතලෙන් ඔරොත්තු දීමට කරන ලද විකල්පයක් වශයෙනි. පසුකාලයේ දී මෙම ස්වභාවික තත්ත්වයන්ට මුහුණදීමේ අවශ්‍යතාවයෙන් නිර්මාණය කළ ඇඳුම් මිනිසුන්ට කිසියම් අලංකාරයක් ලබාදීමට හා සිරිතක් වශයෙන් ඇඳීමට ද අවස්ථාව කොටගෙන ඇත. මිනිසා හා ඔහුගේ සමාජයන් තුළ, විවිධාකාරයෙන් ඇඳුම ඉදිරිපත් කොට ඇත.

ලංකා ඉතිහාසයෙහි ඇඳුමෙහි ඉතිහාසය විමසීමේදී ආදි මානවයා භාවිත ඇඳුම් පිළිබඳ සාධක හමුවනුයේ අල්ප වශයෙනි. මහාවංසයේ සඳහන් පරිදි විජය කුමරු ලංකාද්වීපය පැමිණීමේදී හමුවන කුවේණිය හා බැඳුණු කතා පුවත අනුව කුවේණිය කපු කැටීමේ යෙදී සිටි බව පැහැදිලි වේ. එසේම ඇඳුම් නිෂ්පාදනය පිණිස අමු ද්‍රව්‍ය ලෙස කපු භාවිත කොට ඇත. මෙහිදි කපු භාවිතය සඳහා කපු මෙරට වගා කළ බව සාහිත්‍ය මූලාශ්‍රය තුළ වේ.

විශේෂයෙන් පුරාණ ලංකාවේ ඇඳුම් සමාජ තත්ත්වයන්, සමාජ සංස්කෘතීන් දෘශ්‍යමාන කරන ප්‍රබල මාධ්‍යයක් බවට පරිවර්තනය වී ඇත. විශේෂයෙන් රජවරුන්, ප්‍රභුවරුන් හා වංශවතුන්, සාමාන්‍ය ජනතාව ආදි කොට ගත් සමාජයේ විවිධ තරාතිරම්වලට අයත් ජනතාව තම අනන්‍යතාව හා නිලතලයන් පෙන්වීම පිණිස ඇඳුම භාවිත කොට ඇත. මේ අනුව ඇඳුම තුළින් ලාංකේය පුරාණ සමාජයෙහි පන්ති විෂමතාවයන් මනාව දෘශ්‍යමාන වී ඇත.

අතීතයේ පටන් ලාංකිකයන්ගේ ඇඳුම් පැළඳුම් අතර රාජකීය ඇඳුමට විශේෂ තැනක් හිමිව ඇත. මාර්ටින් වික්‍රමසංහ මහතා සඳහන් කරන පරිදි මුල් කාලයේ රාජකීය ඇඳුම ලෙස ඉතා සරලව අවම ඇඳුමක් පැවති පසුකාලයේ මෙය විකාශනය වී ඇත. මහාවංසය, සිහලවත්ථුපකරණය, ධාතුවංසය ආදියෙහි සඳහන් ඉතිහාසය කතා පුවත් රාශියක රජවරුන්ගේ වස්ත්‍ර පිළිබඳ තොරතුරු දැක්වේ. එසේම රාජකීය ඇඳුමින් සැරසුණු අවලෝකිතේශ්වර බෝසත් රූපය, රජකුගේයැයි අනුමාන කරන යටාල වෙහෙර ඇති රූපය යන පුරාවිද්‍යාත්මක සාධක මගින් ද වස්ත්‍ර පිළිබඳ තොරතුරු හඳුනාගත හැකිය.

තවද රජවරුනට මෙන්ම රාජකීය ප්‍රධානීන්, නිලමේවරු, රාජ නිලධාරින් හා වංශවතුන් ඇතුළු වංශවත් කාන්තාවන්ද සඳහා ද විශේෂිත වූ ඇඳුම් පැවතී ඇත. මෙකල විසූ ජනතාව බොහෝ විට සළු දෙකක් හැඳී බව මූලාශ්‍රවල දැක්වේ. එය හඳනා සළුව හා පොරෝනාව විය. රජු මෙන්ම ඇමතියන් හා ධනවත් අය මෙය හැඳ ඇත. මෙම පිරිසගේ වස්ත්‍ර ගැන පුරාවිද්‍යාත්මක සාධක තුළද දැක්වේ. නිදසුන් ලෙස ඉසුරුමුණිය පෙම් යුවළ, සීගිරි සිතුවම් දැක්විය හැකිය.

තවද ලක්දිව ආදි යුගවල සිටම 18වන සියවස තෙක් ඉතිහාසය පුරා පොදු සාමාන්‍ය ජනතාව ප්‍රභුවරුන් මෙන් විසිතුරු නොවූ නමුදු සාමාන්‍ය ඇඳුම් පැළඳුම් භාවිත කොට ඇත. බොහෝ විට මේවා ඉගටිය සිට දෙදණ තෙක් විය.

මෙම ඇඳුමෙහි විකාශනය සමඟ ඇඳුමට පරිබාහිරව අංග එක් විය. මෙහිදි ආභරණ විශේෂ වන අතර ඇඳුම භාවිතයට පෙර සිට ආභරණ පැළඳීම පුරාණ සිහල සමාජයේ දක්නට ලැබේ. මුල් කාලයේ ස්වභාවික ද්‍රව්‍යවලින් සාදා ගත් ආභරණ පැළඳි අතර පසු කාලීනව ලෝහ භාවිත කොට තිබේ.

සමස්තයක් ලෙස ගත් කල පුරාණ සිංහලේ ඇඳුම් ආයිත්තම් පිළිබඳව අධ්‍යයනය තුළින් ලංකාවේ අතීත කාලයේ සිට වැඩවසම් අවධිය තෙක් මෙරට භාවිත ඇඳුම් අවශ්‍යතාවය හා සමාජ සංස්කෘතික බලපෑම් මත නිර්මාණය වී ඇති අතර වස්ත්‍රය වූකලී පුද්ගල මානයන් පිළිඹිබු කරන කැඩපතක් යන්න දැක්වීම යුක්ති යුක්තය.

### ආශ්‍රිත ග්‍රන්ථ


අමරසිංහ, මාලිංග (2000) **පුරාණ සිංහලේ ඇඳුම් ආයිත්තම්,** ඇම්.ඩී. ගුනසේන සහ සමාගම, 217, ඔිල්කට් මාවත, කොළඹ 11.

අමරවංශ හිමි, කොත්මලේ (1969), **ලක්දිව සෙල්ලිපි**, කොළඹ